**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචක) - 2023**

---

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (ව්‍යාපෘති සංරචකය) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
ප්‍රමුඛ විෂයයන්ට (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශ) රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.
ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩො මිලියන 100 මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි.
ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් සහ පාලනය භාරව සිටින අයගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අනුමත සේවක සැලැස්ම අනුව ව්‍යාපෘති කාර්යාලය සඳහා කළමනාකරණ සහකාරවරුන් 08 දෙනෙකු අනුමත වී තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් අධීක්ෂණ සහ සහය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබූ අතර කළමනාකරණ සහකාරවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය මේ හේතුව නිසා ව්‍යාපෘතියෙන් ක්‍රමානුකූලව ඉල්ලා අස්විය. ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්න බැවින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අඩු කරන ලෙස අමාත්‍යාංශයෙන්ද උපදෙස් දී ලබා දී ඇති | චක්‍රලේඛ උපදෙස් අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| කණ්ඩායම(OMST) සඳහා කිසිවකු සේවයේ යොදවා නොතිබුණි. තවද අනුමත සේවක තනතුරු 33 න් තනතුරු 12 ක් පමණක් පුරවා ඇති බව නිරීක්ෂණය විය. මෙයට අමතරව 2023 වර්ෂය තුළ AHEAD මෙහෙයුම් ව්‍යාපෘති කාර්යාලය - OMST සඳහා තාක්ෂණික සහකාරවරුන් 10 දෙනෙකු අනුමැතියකින් තොරව සේවයේ යොදවා ඔවුන් වෙනුවෙන් 2023 වර්ෂය තුළ දීමනා ලෙස රු.10,362,728ක් ගෙවා තිබුණි. | බව.<br>රජය විසින් නව බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ව්‍යාපෘති කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සමහර අනුමත සේවක තනතුරු වෙනුවට කාර්මික සහකාරවරුන් ව්‍යාපෘතිය වෙනුවෙන් සේවය කිරීමට යොදා ගැනීමට සිදු වූ බව. ණය ගිවිසුමේ කොටසක් වන ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි කාර්මික සහකාරවරුන් පත්කිරීම සඳහා විධිවිධාන ඇති බව. 2019 අප්‍රේල් 29 වැනි දින පැවති මෙහෙයුම් කමිටු රැස්වීමේදී ද කාර්මික සහකාරවරුන් පත් කිරීම අනුමත කර ඇති බව.<br>කාර්මික සහකාරවරුන් සඳහා ගෙවනු ලබන වැටුප් අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS6 හි වැටුප් පරිමාණයන් සමඟ අනුකූල වන බව. | |

**2.2 ආර්ථික නොවන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවලට අනුව Operational Monitoring and Support Team (OMST) ගොඩනැගිලි පරිශ්‍රයේ 2023 වර්ෂය තුළ OMST කාර්ය මණ්ඩලය 22 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටියදී රු.29,350,607 ක මුදලක් වැය වී තිබූ අතර එයට කාර්යාල කුලිය ලෙස රු.21,120,000ක් ද, කාර්යාල පිරිසිදු කිරීමේ ගාස්තු ලෙස රු.1,658,057 ක් සහ විදුලිය ගාස්තු ලෙස රු.6,572,550 ක්ද ඇතුළත් විය. | පසුගිය වසරේ අප පැහැදිලි කළ පරිදි තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කාර්යාල පරිශ්‍රය තෝරාගනු ලැබූ බව. මෙම කාර්යාල පරිශ්‍රය කුලියට ගැනීමට පෙර ගොඩනැගිලි කිහිපයක් සලකා බැලූ අතර මෙය වඩාත්ම ලාභදායී කුලී අනුපාතය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන කාලය තුළ රු.700,000 ක මාසික කුලියකට තුන්වන මහල පමණක් කුලියට ගෙන ඇති බව. | ආර්ථිකමය වශයෙන් වාසිදායක අයුරින් වියදම් දැරීම සිදු කළ යුතුය. |